**ඇකඩමි ඔෆ් ෆයිනෑන්ෂල් ස්ටඩීස් (ඇපයෙන්) සීමිත සමාගම - 2017**

---

ඇකඩමි ඔෆ් ෆයිනෑන්ෂල් ස්ටඩීස් (ඇපයෙන්) සීමිත සමාගමේ ("සමාගම") 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ක්‍රියාකාරකම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ 24 ඡේදයේ 4(බී) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ("සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති") වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("මණ්ඩලය") වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

------------------------------

මෙම වාර්තාවේ 2.3 ඡේදයේ දක්වා දැති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ඇකඩමි ඔෆ් ෆයිනෑන්ෂල් ස්ටඩීස් (ඇපයෙන්) සීමිත සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ කුඩා හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (" කුඩා හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති") අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව

--------------------------------------------------------------------

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තියේ නිගමනය පරිදි පහත ප්‍රකාශ සිදු කරමි.

(අ) මතය සඳහා පදනම හා විෂය පථය සහ විගණනයේ සීමා කිරීම් පහත පරිදි දක්වනු ලැබේ.

(ඇ) මාගේ මතය වනුයේ :

- මෙම වාර්තාවේ 2.3 වගන්තියේ විස්තර කෙරෙන කරුණු වල බලපෑම හැර,විගණනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද බවත්, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්,
- සමාගමේ මූල්‍ය ප්‍රකාශන, 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට ඉදිරිපත් කර ඇති බවත්ය.

### 2.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

#### 2.3.1 සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සමඟ අනුකූල වීම (ශ්‍රීලංගිප්‍ර/ශ්‍රීලංමුවාප්‍ර)

------------------------------------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයෙහි වූ සංසන්දනාත්මක තොරතුරු සහ දේපල පිරියත උපකරණ වලට අදාල සටහන් හෙළිදරව් කිරීමට අසමත් වී තිබුණි.

(ආ) හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයෙහි අනාවරනය කර ඇති වටිනාකම රු.4,430,707 ක් වූ පෙර වර්ෂයේ ගැලපීම් වලට අදාල වැරදි වල ස්වභාවය මූල්‍ය ප්‍රකාශනයන්හි හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) ජෛව විද්‍යාත්මක වත්කම් හා පරිඝනක මෘදුකාංග වල ධාරණ අගය පිළිවෙලින් රු.897,360 හා රු.1,626,390 වෙන් වෙන් අයිතම වශයෙන් සටහන් කිරීමකින් තොරව දේපල පිරියත උපකරණ යටතේ වර්ගීකරණය කර තිබුණි.

### 2.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල රු.154,000,000 ක ස්ථාවර තැන්පතු වෙනුවෙන් වූ පොලී ආදායම ගණනය කිරීමේ දෝෂයක් හේතුවෙන් රු.488,131 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගත් පිරිවැය රු.220,000 ක් වූ පරිසනක උපාංග(මූසික), තොරතුරු තාක්ෂණ හා පුහුණු උපකරණ යටතේ ප්‍රාග්ධනීත කිරීම වෙනුවට නඩත්තු වියදම් යටතේ දක්වා තිබුණි.

### 2.3.3 නොසැසඳූ වෙනස්කම්

සමාගමේ ස්ථාවර වත්කම් ලේඛණය අනුව 2017 දෙසැම්බර් 31 දිනට ලී බඩු උපකරණ හා සවිකිරීම් වල පිරිවැය රු.62,349,946 විය. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල එය රු.63,452,074 ක් ලෙස දක්වා තිබුණි. එසේ නමුදු මෙම වටිනාකම් දෙක අතර නිරීක්ෂණය වූ රු.1,102,128 ක වෙනස සැසඳීම සඳහා කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

### 2.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පෙර වර්ෂයේ ගැලපීම් වලට අදාලව වටිනාකම රු.564,224 ක් වූ ජර්නල් වවුචර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ගනුදෙනුවලට අදාල විස්තරාත්මක තොරතුරු සැපයීමට නොහැකි වීම හේතුවෙන් 2017 ජනවාරි මාසය තුල සිදු කරන ලද වත්කම්, වගකීම්, හිමිකම්, ආදායම් හා වියදම් වලට අදාල ගනුදෙනු වල එකතු වටිනාකම රු.54,082,156 ක් සත්‍යාපනය/සන්නිරීක්ෂණය කිරීමට නොහැකිවුණි.

### 2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

මිලෝදා ආයතනයට අනුයුක්තව සිටි සේවකයින්ගෙන් ලැබිය යුතු රු.210,414 ක සේවක ණය ශේෂය වසර හතරකට වැඩි කාලයක් අය නොවූ ශේෂයක් ලෙස ගිණුම් වල පැවතුණි.

### 2.5 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 113 වගන්තිය ප්‍රකාරව 2017/18 වර්ෂය සඳහා වන කාර්තුමය ස්ව-තක්සේරු ආදායම් බදු ගෙවීම් සිදු කර නොතිබුණි.

(ආ) 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව කිසියම් කාර්තුවක් සඳහා වන ජාතිය ගොඩනැගීමේ බදු ආපසු යැවීම් සහ ගෙවීම් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඊළඟ මාසයේ 20 වන දින හෝ ඊට පෙර ප්‍රේෂණය කළ යුතුය. කෙසේ වෙතත්, සමාගම මෙම අවශ්‍යතාවයට අනුකූල වීමට නොහැකි වී තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය
-----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල
--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම් වලින් වූ ප්‍රතිඵලය රු.45,477,028 ක බදු පෙර ශුද්ධ ලාභයක් වූ අතර ඉකුත් වර්ෂයේ අනුරූපී බදු පෙර ශුද්ධ ලාභය රු.15,147,291 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.30,329,737 ක ප්‍රමාණාත්මක වර්ධනයක් සමාලෝචිත වර්ෂයේ පෙන්නුම් කෙරුණි. 2017 වර්ෂය තුල පුහුණු වැඩසටහන් ආදායම රු.63,734,903 කින් වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන හේතුව වී තිබුණි.

### 3.2 සමාගමේ අගය එකතු කිරීම
--------------------------------

සේවක වැටුප්,රජයට ගෙවූ බදු හා ක්ෂය කිරීම් සලකා බැලීමෙන් පසු සමාලෝචිත වර්ෂයේ සමාගමේ එකතු කළ අගය රු. 75,031,886 ක් වූ අතර පෙර වර්ෂයේදී එය රු.38,470,908 ක් විය. මේ අනුව සමාලෝචිත වර්ෂයේ එකතු කළ අගය රු.36,560,978 කින් වැඩි වී තිබුණු බව නිරීක්ෂණය විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

### 4.1 කාර්ය සාධනය
-----------------

සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ (B) 2 (f) වගන්තිය අනුව, අදාළ පර්යේෂණවල නියැලීම හා පොත්, සඟරා, වාර්තා හා එවැනි වෙනත් ප්‍රකාශන මුද්‍රණය සමාගමේ ප්‍රධාන අරමුණු වේ.
කෙසේ වෙතත් ආරම්භයේ සිටම සමාගම අරමුණු ළඟා කර ගැනීම සඳහා සංයුක්ත සැලැස්ම හෝ උපමාර්ගයන් සකස් කර හෝ ප්‍රදර්ශනය කර නොතිබුණි.තවද සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් ද පිළියෙල කර නොතිබුණි. මේ නිසා සමාලෝචිත වර්ෂයේ සමාගමේ කාර්යසාධනය විගණනයේදි නිශ්චය කළ නොහැකි විය.

### 4.2 මතභේදාත්මක ස්වරූපයේ ගනුදෙනු
-------------------------------------------

2013 වර්ෂයේදි සමාගමේ කටයුතු සඳහා භාවිතා කිරීමට ගාස්තු අයකිරීමකින් තොරව මුදල් අමාත්‍යාංශය විසින් සපයනු ලැබූ කාර්යාල ගොඩනැගිල්ලේ කොටසක් කුලියට දීමෙන් සමාලෝචිත වර්ෂයේදී රු.4,200,000 ක කුලී ආදායමක් සමාගම විසින් උපයාගෙන තිබුණි. මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත මෙම ආදායම ප්‍රේෂණය නොකර සමාගමේ රඳවා ගෙන තිබුණි.

## 5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

----------------------------------------

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාර ආයතනය විසින් කෙටුම්පත් වාර්ෂික මූල්‍ය ප්‍රකාශන මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ වුවත්, සමාගම 2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ දින 26 ක් ඉකුත් වීමෙන් පසු 2018 මාර්තු 26 දිනදීය.

(ආ) 2017 ජූලි මස සිට අධ්‍යක්ෂ මණ්ඩලය නොමැති වීම හේතුවෙන්, 2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සමාගමේ ප්‍රධාන විධායක නිළධාරියා සහ රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කර තිබුණි. තවද, 2017 ජූලි මස සිට සමාගමේ කාර්යයන් රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ විෂයපථයට ඇතුළත් කර තිබුණි.

### 5.2 සංයුක්ත සැලැස්ම

--------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 ඡේදය ප්‍රකාර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සංයුක්ත සැලැස්මේ පිටපතක් ඊළඟ මුදල් වර්ෂය ආරම්භවීමට අවම වශයෙන් දින 15කට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත්කළ යුතු වුවත්,සමාගම ආරම්භයේ සිටම එවැනි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 5.3 අයවැය ලේඛනමය පාලනය

---------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2 ඡේදය ප්‍රකාරව වාර්ෂික අයවැය සකස් කර, ඊළඟ මුදල් වර්ෂය ආරම්භවීමට අවම වශයෙන් දින 15 කට ප්‍රථම විගණකාධිපති වෙත පිටපත් එවිය යුතු වුවත්, සමාගම මෙයට අනුකූල වී නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා සමාගමේ ප්‍රධාන විධායක නිළධාරීගේ අවධානය සඳහා වරින් වර යොමුකරන ලදී. විධිමත් පරිදි ප්‍රධාන ලෙජරය නඩත්තු කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කිරීම අවශ්‍ය වේ.